# ජාතික අධ්‍යාපන ආයතනය
# සංඥා භාෂාව පිළිබඳ පාඨමාලාව - 2018
# ඉල්ලුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

සංඥා හඳුනා ගැනීම, සංඥා භාෂාවෙන් අදහස් හුවමාරු කිරීම, සංඥා භාෂා පරිවර්තනය සහ සංඥා භාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව නිපුණතා ලබා දීම මෙහි අරමුණ වේ. එක් අවුරුදු අර්ධකාලීන සති අන්ත පාඨමාලාවක් වන මෙහි අධ්‍යයන සැසි ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි විශේෂ පාසල්වලදීත් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත. **උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලා සඳහා සකස් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualifications Framework) අනුව මෙම පාඨමාලාව සකස් කර ඇත.**

### 1 සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (SLQF – Level 3)

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම

සහ

රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම

හෝ

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම

හෝ

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම

හෝ

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම

හෝ

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධ ව කටයුතු කරන පාසලක/ආයතනයක/ දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්ත ව සිටීම

සහ

2017.11.30 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම

**පාඨමාලා ගාස්තු**

| | | |
|---|---|---|
| **ඉල්ලුම්පත් ගාස්තුව** | රු | 200. 00 |
| **ලියාපදිංචි ගාස්තුව** | රු | 1000. 00 |
| **පාඨමාලා ගාස්තුව** | රු | 30000. 00 |

**ඉල්ලුම් කළ යුතු පිළිවෙළ**

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම නම, තනතුර, රාජකාරි හා පෞද්ගලික ලිපිනය, උපන් දිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇතුළත් වන සේ තමා විසින් පිළියෙල කර ගත් ඉල්ලුම්පතක්, මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **607628** දරන ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකට රු.200.00 ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය සමග **''අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම''** යන ලිපිනයට **2017 නොවැම්බර් මස 30** දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. (මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.) ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව - 2018 ''** යනුවෙන් සඳහන් කළ යුතුයි.

**පාඨමාලාවට තෝරා ගැනීම**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම.**
**2017.10.**